# ඔබ ජීවිත රක්ෂණය ගැන දැනුවත් ද?



## මොකද්ද ? මේ ජීවිත රක්ෂණය...

ජිවිත වලට එන අනපේක්ෂිත අවදානමකදී එයින් වන බලපෑම අවම කරගැනීමට ලියාපදිංචි රක්ෂණ සමාගමක් සමඟ ඇති කරගන්නා නීතිමය ගිවිසුමක්. මෙහිදි රක්ෂිතයා මියයෑම, පූර්ණ හෝ අර්ධ අබාධිත තත්වයට පත්වීම හෝ ඔප්පුව කල්පිරීම මත පිවීත රක්ෂණයේ ප්‍රතිලාභ රක්ෂිතයාට හෝ නම් කරන අයකුට හිමිවේ.

## ජීවිත රක්ෂණයක් ලබා ගත යුත්තේ ඇයි?

ඔබට යම් අනතුරක් කරදරයක් සිදුවුහොත් ඔබගේ පවුලේ සාමාජිකයින්ට සිය ජිවන මට්ටම පවත්වාගෙන යාමට මූල්‍ය සහනයක් ලබාදෙන ක්‍රමයකි. විශ්‍රාම ගන්නා දිනකදී එකවර හෝ නිත්‍ය ආදායම් මාර්ගයක් සඳහා ඉතිරි කිරීමේ මාර්ගයකි. දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මුදල් යෙදවිය හැකි අතර රෝගාබාධයක් හෝ අකර්මන්‍යතාවයකදී මූල්‍ය සහනයක් හිමිවේ.



## සුදුසු රක්ෂණාවරණයක් තෝරා ගන්නේ කෙසේද?

පිවීත රක්ෂණයක් තෝරා ගැනීමේ දී ඔබේ අවශ්‍යතාවයන්ට ගැලපෙන තමන්ට අඛන්ඩව ගෙවිය හැකි වාරික මුදලකට රක්ෂණය ලබාගැනීම ඉතා වැදගත් වේ. වැඩි විස්තර අවශ්‍යනම් ලියාපදිංචි රක්ෂණ සමාගමකින්, තැරැව්කාර සමාගමකින් හෝ රක්ෂණ උපදේශකවරයකුගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගත හැක.






**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

11 මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

දුරකථන : (011) 2396184-9 ෆැක්ස් : (011) 2396190

ඊ-මේල් info@ircsl.gov.lk වෙබ් : www.ircsl.gov.lk